# පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාදීම

1.**හැඳින්වීම**

- නොච්චියාගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ ආදායම් ඉහළ නැංවීමේ අභිප්‍රායෙන් හා තම කර්මාන්ත කටයුතු කරගෙන යාමේදී පාරිසරික ක්‍රියාකාරකම් සඳහා වන අහිතකර බලපෑම් අවම කරගැනිම පිණිස, මධ්‍යම පරිසර අධිකාරියේ නියෝගයන්ට,අධීක්ෂණයට හා පාලනයට යටත්ව ජාතික ආරක්ෂණ පනත යටතේ පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාදිමට නොච්චියාගම ප්‍රාදේශිය සභාව කටයුතු යොදා ඇත.

**2.නෛතික අධිකාරය.**

- 1988 අංක 56 දරන පනතින් හා වර්ෂ 2000 අංක 56 දරන පනතින් සංශෝධිත වර්ෂ 1980 අංක 47 දරන ජාතික පාරසරික පනතේ 26 වෙනි වගන්තිය මඟින් පාරිසරික ආරක්ෂණ පනතේ පළමුවෙනි උපලේඛනයේ (ආ) කොටසින් සඳහන් ක්‍රියාකාරකම් සම්බන්ධව සහ එකී ක්‍රියාකාරකම් සම්බන්ධව නඩු පැවරීමට ඇති බලතලද ඇතුළුව එවැනි බලතල, කාර්ය හා කර්තවය වලට අනුභාංගිකව හා සම්බන්ධ වන සියළු ක්‍රියාවන් සඳහා නොච්චියාගම ප්‍රාදේශිය සභාවේ සභාපති වෙත බලය පවරා ඇත.

**3.සේවාලාභියාට තිබිය යුතු සුදුසුකම්**

1.කර්මාන්තය පිහිටි ඉඩමේ ඔප්පුව/බලපත්‍රය/පැවරුම්කරය
2.පදිංචි සහතිකය/ ග්‍රාමනිළධාරි සහතිකය
3.කර්මාන්තයෙන් පිටවන අපද්‍රව්‍ය බැහැර කරන ආකාරය පිළිබඳ ලිපිය
4.අදාල ස්ථානයට පිවිසීමේ මාර්ග සටහන
5. කර්මාන්ත භූමිය වෙනත් අයෙකුට අයත් නම්කැමැත්ත ප්‍රකාශ කිරීමේ ලිපිය(ග්‍රාම නිළධාරි සහතික කරන ලද)
6.කර්මාන්ත බදු ගෙවන ලද ලදුපතේ ඡායා පිටපත

**4.සභාවට තිබිය යුතු සුදුසුකම්**

- **අදාල කර්මාන්ත සඳහා බලපත්‍ර ලබාදිමට අවශ්‍ය නෛතික බලතල මධයම පරිසර අධිකාරිය මඟින්** නොච්චියාගම ප්‍රාදේශිය සභාවේ සභාපති වෙත **පවරා තිබිම**

**5.අය කරනු ලබන ගාස්තු**

- **ක්ෂේත්‍ර පරීක්ෂණ**

| අ.අ | ආයෝජන (රු.) | පරීක්ෂා කිරීමේ ගාස්තුව (රු.) |
| --- | --- | --- |

| | | |
|---|---|---|
| **1** | **250,000 .00 හෝ ඊට අඩු** | **3000.00** |
| **2** | **250,001.00-500,000.00** | **3750.00** |
| **3** | **500,001.00-1,000,000.00** | **5000.00** |
| **4** | **1,000,000.00 ට වැඩි** | **10,000.00** |

- **බලපත්‍ර ගාස්තු රු.4,500.00**

**1980 අංක 47 දරන පාරිසරික පනත**

## පාරිසරික ආරක්ෂක බලපත් ඉල්ලුම් පත්‍රය

**ඉල්ලුම්පත් අංකය :.........................................**

**දිනය :.........................................**

**කාණ්ඩය :...........................................**
**වර්ගය :...........................................**

**කර්මාන්තයේ නම :.........................................................................................................**

**කර්මාන්තයේ වර්ගය හෙවත් ප්‍රාකාරය : යන්ත්‍රානුසාරයෙන් නිෂ්පාදනය කිරීම / කොටස් එකලස් කිරීම/නියම ලෙස මිශ්‍ර කිරීම /නැවත ඇසිරීම /ක්‍රියාවලි / වෙනත්**
**(නිශ්චිතව සඳහන් කරන්න.)**

**ඉල්ලුම්කරුගේ නම :.......................................................................................................**
**.....................................................................................................**

**ලිපිනය :.......................................................................................................**
**.......................................................................................................**

දුරකතන අංකය :...................................................................................................

# 1.කර්මාන්තය සම්බන්ධ සාමාන්‍ය විස්තර

1.1.කර්මාන්තයේ ස්වභාවය :...................................................................................

1.2. කර්මාතය පිහිටි ස්ථානය :..................................................................................

(පිහිටීම සම්බන්ධව සිතියමක් සහ මාර්ග සලකුනු සහිතව එම ස්ථානයට පැමිණිය හැකි මාර්ගය
පැහැදිලි කරන සටහන් හා කරන්න.)

ලිපිනය :.........................................................................................................

1.3. පලාත් පාලන ආයතනයේ නම :...........................................................................

1.4. මෙම පිහිටීම ඇත්තේ අනුමත කාර්මික කලාපයක් ( Industrial Zone ) තුළද?....................

1.5.මූලික ආයෝජන ප්‍රමාණය

දේශීය මුදල් :........................................................................................

විදේශීය මුදල් :........................................................................................

1.6. නිෂ්පාදන ආරම්භ කරන ලද දිනය :

1.7.දිනකට වැඩ මුර සංඛ්‍යාව සහ වේලාවන් :

**1.8. එක් එක් වැඩ මුරය තුළ සේවය කරන සේවක සංඛ්‍යාව :**

**1.9. කර්මාන්තයේ ක්‍රියාකාරිත්වය සහ පිහිටුවීම සඳහා ප්‍රාදේශීය සභා හෝ රාජ්‍ය ආයතනවලින් ලබා ගන්නා ලද අවසරය සම්බන්ධව ලේඛනයක් (කරුණාකර ඡායා පිටපත් අමුණන්න.)**

| | **නම** | **අවලංගු වන දිනය** | **නිකුත් කරන දිනය** |
|---|---|---|---|
| **අ** | | | |
| **ආ** | | | |
| **ඇ** | | | |
| **ඈ** | | | |
| **ඉ** | | | |

**1.10. කි.මී.5ක අර්ධ විෂ්කම්භය තුළ ප්‍රදේශයේ ඉඩම් භාවිතය :**

**නේවාසික /වාණිජ /කෘෂිකාර්මික /හිස් ඉඩම් /විවෘත අවකාශයක් /ප්‍රසිද්ධ ප්‍රදේශයක් /වගුරු බිම් / ලවණ සහිත වගුරුබිම් /කඩොලාන /ස්වභාවික වනාන්තර /වෙනත් (සඳහන් කරන්න.)**

**1.11. කි.මී.2 ක අර්ධ විශ්කම්භයක් තුළ දැනට පවතින කර්මාන්ත /ආයතන /කෘෂිකාර්මික/බිම් සම්බන්ධව ලේඛනයක් :**

**1.12. ප්‍රතිකර්ම පද්ධතියක් (Treatment Plant) සඳහා ඇති ඉඩ ප්‍රමාණය :**

## 2. නිෂ්පාදන ක්‍රියාවලි

**2.1. නිෂ්පාදනය කරන ප්‍රධාන භාණ්ඩවල ලේඛනයක් සහ ධාරිතාවයන් :**

2.2. අතුරු නිෂ්පාදන ලැයිස්තුව :
2.3. ක්‍රියාවලියේ විස්තර :

2.3.1 .භාවිතා කරන ක්‍රියාවලි සම්බන්ධව විස්තරයක් ක්‍රියාවලි ප්‍රවාහ රූප සටහන් සමඟ
(Process Flow Diagram) අමුණන්න.

2.3.2. භාවිතා කරන අමුද්‍රව්‍ය :
(නිෂ්පාදනයේ සෑම අවස්ථාවකදීම දිනකට භාවිතා කරන අමුද්‍රව්‍ය ප්‍රමාණය වෙන් වෙන වශයෙන්
සඳහන් කරන්න.)

2.3.3. භාවිතා කරන රසායන ද්‍රව්‍ය :

රසායන ද්‍රවයේ නම :

වෙළඳ නාමය :

දිනකට භාවිතා කරන ප්‍රමාණය :

2.3.4. ඕනෑම හානිකර / විෂදායක /ගිනි ගන්නා සුළු / පුපුරන සුළු ද්‍රව්‍ය ප්‍රවාහනය සහ හැසිරවීම
සම්බන්ධව යොදා ඇති පූර්වෝපායයන් :

2.3.5. හානිකර / විෂදායක /ගිනි ගන්නා සුළු / පුපුරන ද්‍රව්‍ය සඳහා ගබඩා පහසුකම් :

2.3.6. ගිනි නිවීම සඳහා ප්‍රමාණවත් උපකරණ ඔබ ලඟ තිබේද?

2.3.7. එසේ නම් එබඳු උපකරන සම්බන්ධ විස්තර :

3. ජලය

3.1. ජලය අවශ්‍යතාවය :

නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා : දිනකට ඝන මීටර් - ......................................

සිසිල් කිරීම සඳහා : දිනකට ඝන මීටර් - ......................................

සේදීම සඳහා : දිනකට ඝන මීටර් - ......................................

ගෘහස්ත ක්‍රියාවලි සඳහා : දිනකට ඝන මීටර් - ......................................

3.2. ජලය ලබා ගන්නා ප්‍රභවයන් (Sources)

1.පොදු ජල සැපයුම :

2.භූගත ජලය (ළිං,උල්පත් ) :

3. මතුපිට ජලය (ඇළ, දොළ,ගංගා) :

3.3. සම්පූර්ණ දෛනික මුදා හැරීම :

3.4. මුදා හැරීමේ ක්‍රමය : දිනකට ඝන මීටර්

3.5. අපවිත්‍ර ජලය මුදා හරින අවසන් ස්ථානය කසළ බැස යන /වගුරු බිමක් /කෘෂිකාර්මික භූමියක් :
කානුවක් /වැවක් /ගංගාවක් /ඇළක් /ගං මෝයක් /මුහුදට /වෙනත්

3.6. මුදාහරින වෙනත් විෂදායක ද්‍රව්‍ය මොනවාද?
(ස්වභාවය සහ සාන්ද්‍රණය) සඳහන් කරන්න. උදා :- අකාබනික සහ කාබනික ද්‍රව්‍ය පලිබෝධ

නාශක ඇතුළත්ව, කාබනිකව ක්ලෝරීන් සංයෝග, බර ලෝහ යනාදිය.

3.7. අපවිත්‍ර ජලය ප්‍රතිකර්මයට භාජනය කරන ක්‍රම. ( ප්‍රතිකර්ම ක්‍රියාවලිය සම්බන්ධව රූප සටහනක් අඩංගු කල යුතුය.)

3.8. ප්‍රතිකර්මයට පෙර සහ පසු ,අපවිත්‍ර ජලයේ ආවේනික ගුණාංග වාර්තා කිරීමට යොදා ඇති ක්‍රම:

3.9. ජලය නැවත භාවිතා කරන්නේ නම් නැතහොත් චක්‍රීකරණයට භාජනය කරන්නේ නම් ඒ සම්බන්ධ විස්තර :

## 4. ඝන අපද්‍රව්‍ය

4.1. ඝන අපද්‍රව්‍ය වල ස්වභාවය සහ වර්ගය :

4.2. ඝන අපද්‍රව්‍ය වල සම්පූර්ණ ප්‍රමාණය ( දිනකට කි.ග්‍රෑම් ) :

4.3. ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රම - නාගරික එකතු කිරීමේ ක්‍රමය /බිම් පිරවීම / දහනය / කොම්පෝස්ට් කිරීම /ව විකිණීම /චක්‍රීකරණය

## 5. වායුගෝලීය මෝචනයන් (Atmospheric emissions )

වායු ගෝලයට කිසියම් මෝචනය කිරීමක් ඇද්ද? ඔව් /නැත.
එසේ තිබේ නම් පහත සඳහන් දෑ සම්පූර්ණ කරන්න.

5.1. සිදුවිය හැකි මෝචනයන් :

අ. නයිට්‍රජන් වල ඔක්සයිඩ් වර්ග :

ආ. සල්ෆර් වල ඔක්සයිඩ් වර්ග :

ඇ. දූවිලි සහ දැලි :

ඈ. වෙනත් ද්‍රව්‍යන් :

5.2. දුම් කවුළු / චිමිනි සංඛ්‍යාව :

උස :

## 6. ඔබේ කර්මාන්තයේ දුගඳ සම්බන්ධ ප්‍රශ්න ඇති කරනවාද ?

එසේ තිබේ නම් :

ප්‍රභවය (Source) :

මැඩ පැවැත්වීමට යොදා ඇති ක්‍රම :

## 7. ශබ්ධ දූෂණය

7.1. ඔබේ කර්මාන්තයෙන් ශබ්ධ දූෂණයක් ඇති කෙරේද ? ඔව් / නැත

7.2. එසේ තිබේ නම් :

ප්‍රභවය (Source) :

මැඩ පැවැත්වීමට යොදා ඇති ක්‍රම :

## 8. බලශක්ති අවශ්‍යතාවන් (Energy )

8.1. සම්පූර්ණ බලශක්ති පරිභෝජනය :

අ. උත්පාදන යන්ත්‍රයක් මඟින් ( කි.වොට් පැය වලින් )

ආ. පොදු විදුලි සැපයුම් මඟින් ( කි.වොට් පැය වලින් )

8.2. කර්මාන්තයේ භාවිතා කරන යන්ත්‍රවල විස්තර සහ ඒවායේ අශ්ව බල ප්‍රමාණයන් :

**8.3. භාවිතා කරන ඉන්ධන වර්ගය :**

**අ. භාවිතා කරන්නේ කුමක් සඳහාද?**

**ආ. දෛනික පරිභෝජනය :**

## 9. චක්‍රීකරණය /නැවත පාවිච්චිය :

**9.1. ඕනෑම අපද්‍රව්‍යයක් නැවත පාවිච්චිය සඳහා ලබාගත හැකි ප්‍රමාණය කරන්න.**

## 10. කර්මාන්තය පුළුල් කිරීම.

**අනාගතයේදී කර්මාන්තය පුළුල් කිරීම ගැන ඔබේ විස්තර කරන්න. යෝජිත පුළුල් කිරීමේදී නිෂ්පාදන ක්‍රියාවලිය, අමුද්‍රව්‍ය පාවිච්චිය සහ නිමි භාණ්ඩ වෙනස් කිරීමට බලාපොරොත්තු වන්නේ දැයි යන වග සඳහන් කරන්න.**

**මෙම ඉල්ලුම් පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවරදි බවට මම මෙයින් සහතික කරමි. මෙහි සඳහන් තොරතුරක් ව්‍යාජ හෝ අසත්‍ය බව සොයා ගනු ලැබුවහොත් මාගේ ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරන බවත් බලපත්‍රය නිකුත් කර ඇත්නම් එය අවලංගු කරන බවත් මම හොඳින් දන්නෙමි.**

දිනය :........................................
..........................................

ඉල්ලුම්කරුගේ අත්සන

## රසායනික කර්මාන්තවලින් අවශ්‍ය අමතර තොරතුරු

- පහත සඳහන් පරිදි සවිස්තර තොරතුරු සැපයිය යුතු වේ.

01.පහසුකම් සහිත ඉඩමේ සිට සැතපුම් භාගයක් පැතිර පවත්නා අපසන්දන මුදා හැරීමේ ස්ථාන ළිං,
උල්පත් හා වෙනත් මතුපිට ජල මාර්ග සහ බීමට ගන්නා ළිං වල පිහිටීම චිත්‍රයෙන් දැක්වෙන දළ
සිතියමක්

02.පහත සඳහන් (i) හා (ii) ආශ්‍රිතව එකී පහසුකම් ඇති ස්ථානයේ භාවිත් කරනු ලබන ක්‍රියාමාර්ග
ව්‍යුහයන් සහ උපකරණ සම්බන්ධ විස්තර :

(i) රසායන ද්‍රව්‍ය ප්‍රවාහනයේදී අනතුරු වළක්වාලීම

(ii) රසායන ද්‍රව්‍ය වලට පුද්ගලයින් අධික ලෙස නිරාවරණය වීම වැලැක්වීම
( ආරක්ෂක ඇඳුම් ආදිය )

03.පහත සඳහන් කරුණු ගැන විස්තර :

(i) රසායන ද්‍රව්‍ය ගබඩා කිරිම නිසා ගිනි ගැනීම් වළක්වාලීම සම්බන්ධයෙන් පූර්වෝපායන්

(ii) ප්‍රයෝජන සඳහා ඇති ගිනි නිවන උපකරණ

(iii) ගිනි නිවීම ගැන පුද්ගලයින් පුහුණු කිරීම

04.කාර්මික ක්‍රියාවලියේ පාවිච්චියට පෙර රසායන ද්‍රව්‍ය ප්‍රමාණය ගබඩා කිරීමේ ක්‍රමය ගැන විස්තරයක්

05.පාවිච්චි කරන ලද රසායන ද්‍රව්‍ය ආපසු ලබා ගැනීමට හැකි නම්, එකී ක්‍රමය ගැන විස්තරයක්
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි.)

බලපත්‍ර ඉල්ලුම් අංකය ...........................

කාණ්ඩය :
වර්ගය :

01.ඉල්ලුම් පත්‍රය ලැබුනු දිනය :

02. අදාළ සැලසුම්, වාර්තා සහ වෙනත් ලියකියවිලි ලැබුණේද?

03.අමතර තොරතුරු ඉල්ලා සිටියේ නම් ,එවැනි ඉල්ලීම් සම්බන්ධව විස්තර :

04.වෙනත් ආයතනයක නිරීක්ෂණයක් ඉල්ලා සිටියේ නම්, එවැනි ඉල්ලීම් සම්බන්ධ විස්තර:

05.බලපත්‍ර සඳහා අවසර දුන්නේද යන වග : ඔව් / නැත

06.බලපත්‍රය සඳහා අවසර දුන්නේ නම්,

අ. බලපත්‍ර අංකය :...........................................................................

ආ. බලපත්‍රයේ දිනය :...........................................................................

ඇ. වලංගු කාලය :...........................................................................

ඈ. අවලංගු වන දිනය :...........................................................................

ඉ. අදාළ කොන්දේසි අමුනා ඇත. (ඇත්නම්) :.........................................................

07.බලපත්‍ර ප්‍රතික්ෂේප කළේ, ප්‍රතික්ෂේප කිරීමට හේතු:

දිනය:......................................

...........................................
අවසර දෙන නිලධාරියාගේ
අත්සන සහ තනතුර